නොවේ.

"උදේට කෑව ද..?"

ඔහු පිළිතුරක් නොදෙන්නේ අවධානය සිත්තම කෙරහි යොමුවී ඇති නිසාය. දැඩි අවධානයකින් වැඩෙහි යෙදී සිටින විට ඔහුට කෑම බීම පිළිබඳව හෝ උනන්දුවක් නැති බව ඇය දනියි. ඔහු මේ සා උවමනාවකින් අඳිමින් සිටින මේ සිත්තමේ සිටින යුවතිය තමා කවදා කොතැනකදී හෝ දැක තිබුණ බවක් ශානිකාට මතක ය.

"මං මොනා හරි හදන්න ද..?" ඈ නැවත ඇසුවා ය.

විශ්වජිත් පින්සල පසෙක තබා ශාමිලා දෙස හැරී බැලුවේ ය. සිත තුළ දොරේ ගලනා අප්‍රසාදය වළක්වා ගන්නට ඔහු මහත් වෙහෙසක් ගත්තේ ය.

"මට මේ වැඩේ ඉවර කරන්න ඕනෙ ශාමිලා.. ඔයා දැන් යන්න.. මං කෝල් එකක් දෙන්නම්.."

ඔහු දෙස ටික වේලාවක් බලා සිටි ශාමිලා සිය ගමන් මල්ල කරේ ලා ගත්තා ය. ඇගේ ඇස් කඳුලින් පිරෙනු ඔහු දුටුවේ ය. ඇය අස්වසන්නට යමක් කියන්නට ඔහු  නොසිතුවේ ය.

"මං යන්නං සර්.." ඕ සුපුරුදු ලෙස ඔහුගේ දෙපා වැන්දා ය. ".. ඕනෙ කමක් වුණොත් කෝල් එකක් දෙන්න.. අමතක කරන්න එපා.. අනේ වෙලාවට කෑම බීම ගන්න.. ලෙඩ වෙන්න එපා.. මං යනවා.."

විශ්වජිත් ඇය සමගින් දොර වෙතට ආවේ ය.

දොර අසළදී පාවහන් පැළඳගත් ශාමිලා ඔහු යමක් කියනු ඇතැයි යන බලාපොරොත්තුවෙන් හැරී බැලුවා ය.

"පරිස්සමින් යන්න..." ඔහු පහත් හඬින් කීවේ ය. උස මල් ගස් අතරින් ඇගේ රුව නොපෙනී යන තෙක් බලා සිටි ඔහු ආපසු හැරුණේ ය. පින්සලය අතට ගෙන කැන්වසය ඉදිරියේ සිටගත්තේ ය. දැහැනට සම වැදුණා සේ අමන්දි ගේ රුව කැන්වසය මත මවන්නට පටන් ගත්තේ ය.







ළබන කළාපයට








